# සංවර්ධන සන්නිවේදනය සඳහා සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යවලින් පිටුවහලක් ලැබිය හැකි ද ?

## (සොකරි ගැමි නාටකය ඇසුරෙනි)

කේ. එම්. අයි. ස්වර්ණසිංහ

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
ජනසන්නිවේදනය පිළිබඳ
සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදී.

1999 ඔක්තෝබර්

# නිබන්ධ සාරාංශය

"සංවර්ධන සන්නිවේදනය සඳහා සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යවලින් පිටුවහලක් ලැබිය හැකිද?" යන්න මෙම පර්යේෂණයේ මාතෘකාව වේ. එහිදී අපගේ උපන්‍යාසය වූයේ, සංවර්ධන සන්නිවේදනය සඳහා සාම්ප්‍රදායික සන්නිවේදනය මාධ්‍ය හෙවත් ගැමි මාධ්‍යවලින් පිටුවහලක් ලැබිය හැකිය යන්නයි.

මෙහිදී අප විසින් ප්‍රථමයෙන්ම, "සන්නිවේදනය සහ සාම්ප්‍රදායික සන්නිවේදනය" යනු කුමක්දැයි නිර්වචනය කෙරේ. මහාචාර්ය විල්බර් ශ්‍රාම්, මහාචාර්ය එවරට් එම්. රොජර්, මහාචාර්ය විමල් දිසානායක ඇතුළු විද්වතුන් රැසක් මෙන්ම ඔක්ස්පර්ඩ් ශබ්ද කෝෂයද, සන්නිවේදනය යනු කුමක්දැයි විවිධ ආකාරයෙන් අර්ථ දක්වා තිබේ. ඒ අර්ථවල හරය හකුළුවා ගත් විට පෙනෙන්නේ, යම්කිසි සන්නිවේදකයෙක් කුමන හෝ මාධ්‍යයක් ඔස්සේ, ග්‍රාහකයෙකුට පණිවුඩයක් යැවීම සන්නිවේදනය බවත්, ග්‍රාහකයා වෙතින් යළි සන්නිවේදකයාට ප්‍රතිපෝෂණය ලැබීමත් සමඟ සන්නිවේදන කාර්යය සම්පූර්ණ වන බවත් වේ. මේ මඟින් මානව ශිෂ්ටාචාරය ගොඩ නැඟීමට මහත් මෙහෙවරක් සිදු වී තිබේ. සන්නිවේදනය ජනසන්නිවේදනය බවට පත් වීමත් සමඟම, ලෝකය විශ්ව ගම්මානයක් බවටත්, සාම්ප්‍රදායික සමාජ, තොරතුරු සමාජ බවටත් පරිවර්තනය වී තිබේ. සන්නිවේදනයේ මෙම විවිධ අංශ විමර්ශනය කිරීමෙන් අපට කළ හැකි වැදගත් නිගමනයක් තිබේ. එනම්, සන්නිවේදනය යනු, පුද්ගලයා ලෝකය සමඟත්, ලෝකය පුද්ගලයා සමඟත් සම්බන්ධ කරන්නා වූ වැදගත් උපකරණයක් බවයි. දෙපැත්ත කැපෙන සියුම් ආයුධයක් බඳු වූ සන්නිවේදනය, හැමවිටකම භාවිත කළ යුත්තේ මානවයාගේ ප්‍රගමනය උදෙසා මිස, අවගමනය උදෙසා නොවේ.

සාම්ප්‍රදායික සන්නිවේදනය යනු සාම්ප්‍රදායික සමාජවල මානවයා, සිය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා උපදවා ගත් සන්නිවේදන උපක්‍රමයයි. ඒවා එම සරල සමාජවල, සාම්ප්‍රදායික අංග ලක්ෂණ හා තාක්ෂණය ඇසුරින් බිහි වී තිබේ. මෙකී ගැමි මාධ්‍ය ඔවුන්ගේ සංස්කෘතිය හා අවියෝජනීය ලෙස බැඳී තිබේ. එම නිසාම, විශ්වාසනීයත්වය සහ අර්ථාවබෝධය අතින් සාම්ප්‍රදායික සන්නිවේදනය, නවීන ජනමාධ්‍යවලට වඩා ඉදිරියෙන් සිටී.

සංවර්ධනය වශයෙන් බොහෝ විට අර්ථ දක්වනු ලැබ ඇත්තේ, යම් සමාජයක වැඩි දියුණුවක් හෝ වර්ධනයක් හෝ වේ. තුන්වෙනි ලෝකයට අයත් සේ සැලකෙන රටවල් තමන්ගේ දරිද්‍රතාවයෙන් නැඟී සිටීමට ගන්නා උපාය මාර්ග සංවර්ධන උපාය මාර්ග ලෙස සැලකේ. මුල් කාලයේ, සංවර්ධිත බටහිර රටවල් මේ සඳහා පූර්වාදර්ශයට ගන්නා ලදී. ප්‍රාග්ධනය සහ තාක්ෂණය වැපිරීමේ ප්‍රාග්ධන සූක්ෂම සැලැස්ම මඟින් රටකට සංවර්ධනය විය හැකි බව විශ්වාස කෙරිණ. එහෙත් ආර්ථිකයට මුල් තැන දුන් මෙකී සංවර්ධන ක්‍රියාදාමය නිසා හැටේ දශකය අවසාන වන විට, සංවර්ධනය අපේක්ෂා කළ රටවල්වලට අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගත නොහැකි විය. ඒ වෙනුවට නොයෙකුත් අනපේක්ෂිත ප්‍රශ්න හා ගැටලු මතු විය. මේ නිසාම එකී උපාය මාර්ගයේ අසාර්ථක භාවය වටහා ගත් විද්වතුන්, මානව සම්පත මුල් කරගත්, ශ්‍රම සූක්ෂම සැලැස්ම, සංවර්ධන උපාය මාර්ගයක් වශයෙන් ඉදිරිපත් කළහ. මෙය දිගු සංස්කෘතියකින් පිරිපුන් තුන්වන ලෝකයේ රටවලට වඩාත් අර්ථවත් එකක් විය. මේ මඟින් මානවයාගේ, භෞතික මෙන්ම අභෞතික අංශයද එකසේ දියුණු කිරීම අපේක්ෂා කෙරිණ. මේ අනුව සංවර්ධනය වශයෙන් අප විසින් හඳුනා ගනු ලබෙන්නේ, සිය මූලික භෞතික අවශ්‍යතා නිසි ලෙස සපුරා ගත්, තෘප්තිමත් සාමාජිකයන්ගෙන් පිරිපුන් සමාජයක් බිහි කිරීමයි.

එවන් සමාජයක් බිහි කිරීම සඳහා, සන්නිවේදනය යොදා ගත් විට එය සංවර්ධන සන්නිවේදනය වශයෙන් හැඳින්වේ. එකී සන්නිවේදනය, සන්නිවේදකයා වෙනුවට, ග්‍රාහකයා කේන්ද්‍ර කර ගත් එකකි. පුද්ගලාන්තර සන්නිවේදනයට වඩාත් නැඹුරු වන එකකි. මන්දයත් සංවර්ධන සන්නිවේදනයේදී ප්‍රතිපෝෂණය ඉතාම වැදගත් වන බැවිනි.

ශ්‍රී ලාංකික ජන සමාජයෙන් 75% කට වැඩි ප්‍රමාණයක් ග්‍රාමීය ජනතාව බව 1981 ජන සංගණන වාර්තා පෙන්වා දී තිබේ. ගම යනු ශ්‍රී ලාංකික සංස්කෘතියේ මූල සිටම පැවති, පාලනයේ කුඩාම ඒකකය විය. එකී ගැමි, ජනතාව කෘෂිකාර්මික ජීවිතයක් ගත කළහ. ඉන් උපන් කෘෂක සංස්කෘතියකට ඔවුහු උරුමකම් කීහ. සිංහල බෞද්ධ සංස්කෘතිය යනු එම සංස්කෘතියයි. මෑත කාලීනව සිදු වූ සංචලතාවන් නිසා, ශ්‍රී ලාංකික ගැමි සමාජය තුළ යම් යම් වෙනස්කම් දක ගත හැකිය. එහෙත් අද පවා, තම සංස්කෘතියේ බලපෑම එම ජන ජීවිතයේ විද්‍යමාන වේ. සංවර්ධනය සඳහා මෙන්ම සංවර්ධන සන්නිවේදනය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහාද මෙම පසුබිම වටහා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලාංකික, සංස්කෘතිය වෙතින් උපන් විවිධ ශාන්තිකර්ම හා ගැමි නාට්‍ය අතර, "සොකරි" ඉතා වැදගත් තැනක් ගනී. මෙම ගැමි නාටකය, සශ්‍රීකත්වය හා බැඳී පවතී සොකරි නම් වූ වඳ ස්ත්‍රියට දරුවෙකු ලැබීම මෙහි මූලික තේමාවයි. ඉන් සශ්‍රීකත්වය පැහැදිලි වේ. නාටකය පුරාම දිවෙන විවිධ අවස්ථා ඔස්සේ මිහිකත ගැබ් ගැන්වීම, සංසර්ගය වැනි අවස්ථා අනුකරණාත්මකව නිරූපණය කෙරේ. මෙය පුරාණ සමාජවල තිබූ අනුකරණය මගින් සශ්‍රීකත්වය පෙන්නුම් කළ හෝ ප්‍රාර්ථනා කළ ක්‍රියාවලියක පරිණාමයක් සේ විද්වත්හු දක්වති. කොටු වී සිටින ගැමි සමාජයකට, එකී ඒකාකාරී බවින් මොහොතකට හෝ මිදී සහනයක් ලැබීමේ ලක්ෂණයද මෙහි ගැබ්ව පවතී. සොකරි ගැමි නාටකයේ ඇති සංවර්ධනාත්මක, සහ නාටකීය ලක්ෂණත් ගැමියාට සහනයක් ගෙනෙන ස්වභාවයත් සංවර්ධන සන්නිවේදනය සඳහා ඉතා යෝග්‍ය වේ.

ශ්‍රී ලාංකික ජනතාවගෙන් වැඩි දෙනෙකු තොරතුරු ලබා ගන්නේ ගුවන්විදුලිය හා රූපවාහිනිය මගිනි. පුවත්පත මගින් තොරතුරු ලබා ගැනීම තුන්වැනි ස්ථානයට පත් වී තිබේ. එහෙත් මෙම ජනසන්නිවේදන මාධ්‍ය මගින් ලැබෙන තොරතුරුවල විශ්වාසනීයත්වය බොහෝ අඩු බව ගැමි ජනතාව සිතති. රූපවාහිනිය හා ගුවන්විදුලිය වෙතින් මෙන්ම, ගැමි මාධ්‍ය හා සංගීත සන්දර්ශන ආදියෙන්ද ඔවුහු ප්‍රධාන වශයෙන් විනෝදාස්වාදය ලැබීමට පුරුදු වී සිටිති.

ගැමි ජනතාව සංවර්ධනය වශයෙන් දකින්නේ, සමස්ත සමාජයේම ආර්ථික හා ආධ්‍යාත්මික වර්ධනයකි. එකී සංවර්ධනය සඳහා ජනමාධ්‍ය වෙතින් ලැබෙන තොරතුරු ඔවුනට විශ්වාසනීයත්වයෙන් තොරය. දුර්වාවබෝධී ගුණයෙන් යුක්තය. තමනට සමීප, ප්‍රශ්නකර වටහාගත හැකි ක්‍රමයකට සංවර්ධන සංදේශ ලැබේ නම් ජනතාව ඊට බොහෝ කැමතිය.

විශ්වාසනීයත්වයෙන් සහ ප්‍රතිපෝෂණය ලැබීම අතින් දුර්වල, නවීන ජනමාධ්‍ය, ඔස්සේ සංවර්ධන සන්දේශ ජනතාව වෙතට ගෙන යාම එතරම් ඵලදායී නොවේ. එමගින් ඔවුන්ගේ සාම්ප්‍රදායික ආකල්ප අර්ථවත්ව වෙනස් කිරීමේ හැකියාව මඳය. ඔවුන්ව සංවර්ධන ක්‍රියාවලියට ක්‍රියාශීලීව සහභාගී කරවා ගැනීම සඳහා පොළඹවාලීමට ඇති හැකියාවෙන් ඒවා හීනය. සොකරි නාටකය පුරා දිවෙන හාස්‍ය තුළින් උපදින විනෝදය, එහි ඇති සමීප බව මෙන්ම තමන්ගේම නෑසිය හිතවතුන් එහි රඟපෑම නිසා ගැමියා ඊට බොහෝ සේ බැඳී සිටිති. ඒ ඔස්සේ මතු කෙරෙන සශ්‍රීකත්වය පිළිබඳ අර්ථකථනයක්, නාටකීය ගුණාංගත් එක්කර, සංවර්ධනය පිළිබඳ සන්දේශ ඉතා නිර්මාණශීලීව මතු කෙරෙන සේ සොකරි නවීකරණය කළ හැක. එය සංවර්ධන සංදේශ ජනතාව වෙත ගෙන යෑම සඳහා ඉතා සුදුසු මාධ්‍යයක් වේ.